# IV. කාර්ය මණ්ඩල පුවත්

අධිපති, එච්. ඊ. තෙන්නකෝන් මහතා අග්නිදිග ආසියාතික මහ බැංකු අධිපතිවරුන්ගේ හත් වැනි සමුළුවට සහභාගිවීම සඳහා 1972 පෙබරවාරි 5 වැනි දින මැලේසියාවට පිටත්ව ගොස් 1972 පෙබරවාරි 13 වැනි දින ආපසු පැමිණියේ ය.

ඕස්ට්‍රේලියානු රජයේ ආරාධනාවක් පිට 1972 අප්‍රේල් 11 වැනි දින ඕස්ට්‍රේලියාවට ගිය අධිපතිවරයා 1972 මැයි 2 වැනි දින ආපසු පැමිණියේය ඔහු එතෙර සිටි කාලය තුළ ඕස්ට්‍රේලියානු බැංකු සහ මූල්‍ය බලධරයන් සමග සාකච්ඡා පවත්වා ඇත.

අධිපතිවරයා, 1972 මැයි 25 වැනි දින ටෝකියෝවෙහි දී, ආසියානු නිෂ්පාදිත සංවිධානයේ පාලක මණ්ඩලයේ දහ හතර වැනි සැසි වාරයට සහභාගිවී 1972 ජුනි 11 වැනි දින ආපසු දිවයිනට පැමිණියේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව වෙනුවෙන් විකල්ප අධිපතිවන අධිපතිවරයා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකාව නියෝජනය කරන අධිපති වන මුදල් ඇමති ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා සමග වොෂින්ටන්හි පැවැත්වූ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ වාර්ෂික සභා රැස්වීම්වලට සහභාගි විය. 1972 සැප්තැම්බර් 16 වැනි දින ශ්‍රී ලංකාවෙන් පිටත්වූ අධිපතිවරයා 1972 ඔක්තෝබර් 14 වැනි දින ආපසු පැමිණියේය.

1972 පෙබරවාරි 5 වැනි දින සිට 13 වැනි දින දක්වා අධිපතිවරයා කාර්යාලයෙන් බැහැරව සිටි කාලච්ඡේදය තුළ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති පදවියට පත් කරනු ලැබූ නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය. 1972 අප්‍රේල් 7 වැනි දින සිට ආචාර්ය තිලකරත්න මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරනු ලැබූ අතර, අනතුරුව අධිපතිවරයා එතෙර ගොස් කාර්‍යාලයෙන් බැහැරව සිටි කාලසීමාවන්හි දී (1972 මැයි 25 වැනි දින සිට 31 වැනි දින දක්වා පැරීසියේ පැවැත්වූ ලංකා ආධාර කණ්ඩායම් 8 වැනි සභා වාරයට සහ ලන්ඩනයේ සාකච්ඡාවලට සහභාගිවීමට ඔහු එතෙර සිටි කාලය තුළ හැර) ඔහු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය. 1972 නොවැම්බර් 1 වැනි දින සිට ඒ මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් වැඩ බාරගත්තේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ සභා වාරයන්ට සහභාගිවීම් වස් මුදල් අමාත්‍යාංශයේ ලේකම්, සී. ඒ. කුරේ මහතා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි කාලච්ඡේදය තුළ, මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් එල්. බී. අබේරත්න මහතා මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

නියෝජ්‍ය අධිපති, ආචාර්ය ගාමිණී කොරයා මහතා වර්ෂය මුළුල්ලේම නිවාඩු ලබා සිටි අතර ඒ මහතා මෙම කාලච්ඡේදය තුළ සසෙක්ස් විශ්ව විද්‍යාලයේ සංවර්ධන අධ්‍යයන ආයතනයේ බාහිර සම්මාන සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය. 1972 මාර්තු සහ ඔක්තෝබර් මාසයන්හි එක්සත් ජාතීන්ගේ කොකෝවා සම්මේලනයේ සෙසවරි සභාපති වශයෙන් තේරුනු ඒ මහතා, 1972 අප්‍රේල්හිදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන සැලසුම් කමිටුවේ සභාපති වශයෙන්ද තෝරා පත් කර ගන්නා ලදී. 1972 ජුනි මාසයේදී එක්සත් ජාතීන්ගේ මිනිස් පරිසර සම්මේලනයට එහි ප්‍රධාන ලේකම්වරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් ඔහු සහභාගි විය. තවද, ඔහු එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධන පර්යේෂණ ආයතනයේ 'සංවර්ධන ඒකාබද්ධ මාර්ගය' පිළිබඳ යෝජනා ක්‍රමයක උපදේශකවරයෙකු වශයෙන් ද, 1972 නොවැම්බරයෙහි දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන ඒකාබද්ධ මාර්ගයේ විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කළේය. දෙවැනි සංවර්ධන දශකය තුළ ඔහු ආසියානු කලාපයේ ආසියානු හා ඈත පෙරදිග ආර්ථික කොමිෂමේ විශේෂඥ කණ්ඩායමේ සභාපති වශයෙන් 1972 දෙසැම්බර් මාසයේදී කටයුතු කළේය.

අධිපතිගේ ජ්‍යෙෂ්ඨ සහකාර, පී. වී. එම්. ප්‍රනාන්දු මහතා මුදල් නීති පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාර, 1972 අප්‍රේල් 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරන ලදී. ආසියානු නිෂ්පාදන සංවිධානයේ ටෝකියෝවේ පැවැත්වූ දහහතර වැනි සැසි වාරයට සහභාගිවීම සඳහා අධිපතිවරයා කාර්යාලයෙන් බැහැරව එතෙර සිටි 1972 මැයි 25 වැනි දින හා පැරිසියේ පැවැත්වූ ලංකා ආධාර කණ්ඩායමේ 8 වැනි සභා වාරයට හා ලන්ඩනයේ සාකච්ඡාවලට සහභාගිවී ආචාර්ය තිලකරත්න මහතා පෙරළා දිවයිනට පැමිණි 1972 මැයි 31 වැනි දින දක්වා අතර කාලය තුළ, මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, ඒ මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති පදවියට පත් කරනු ලැබූ අතර, ඔහු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන ලදී.

1972 සැප්තැම්බර් 1 වැනි දින සිට ප්‍රධාන ගණකාධිකාරී කේ. ගුණරත්නම් මහතා අධිපතිගේ සහකාර වශයෙන් පත් කරන ලදී.

1972 සැප්තැම්බර් 1 වැනි දින සිට නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී ඒ. බණ්ඩාරනායක මහතා වැඩ බලන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

1972 ජූනි 21 වැනි දින සිට ටී එස්. මුතුලිංගසාමි මහතා, උපදේශකයෙකු (පුහුණු කිරීමේ) වශයෙන් පත් කරන ලදී.

එස් තයනිති මහතා සහ ඒ. එච්. ද සිල්වා මහත්මිය තවදුරටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවාවේ නියුතු විය.

බී. බී. ඩී. එම්. පෙරේරා මහතා එක්සත් ජාතීන්ගේ සේවාව සඳහා තවදුරටත් සවුදි අරාබියාවේ රැඳී සිටියේය.

වැවිලි හා කර්මාන්ත අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදා හැරීමක් ලත් ඒ. එස්. ජයවර්ධන මහතා 1972 ඔක්තෝබර් මස 1 වැනි දින සිට බැංකු සේවාවට නැවත පැමිණියේය. සේවාවෙන් මුදා හරිනු ලැබ සිටි කාලච්ඡේදය තුළදී ජයවර්ධන මහතා ඉඩම් ප්‍රතිසංස්කරණ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීය. බැංකුවේ රාජකාර්ය කටයුතු නැවත බාර ගැනීමෙන් පසුවද එකී පත්වීමේ කටයුතු දිගටම ඔහු විසින් කර ගෙන යන ලදී.

මුදල් අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදා හැරීමක් ලත්. පී. සී. මුණසිංහ මහතා 1972 ජුලි 1 වැනි දින සිට බැංකු සේවාවට නැවත පැමිණියේය.

ආචාර්ය ජී. උස්වත්තෙ ආරච්චි මහතා තවදුරටත් එක්සත් ජාතීන්ගේ සේවාවේ නිරත විය.

විදේශීය වෙළෙඳ අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදාහැරීමක් ලත් ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහතා 1972 ඔක්තෝබර් 1 වැනි දින සිට බැංකු සේවාවට නැවත පැමිණියේය. සේවාවෙන් මුදා හරිනු ලැබ සිටි කාලච්ඡේදය තුළදී ආචාර්ය ප්‍රනාන්දු මහතා නියෝජිත ආයතන සහ තැරව්කාර ව්‍යාපාර ආයතන පරීක්ෂණ කොමිසමේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදී. බැංකුවේ රාජකාර්ය කටයුතු නැවත බාර ගැනීමෙන් පසුවද එකී පත්වීමේ කටයුතු දිගටම ඔහු විසින් කර ගෙන යන ලදී.

විමර්ශනයට භාජනය වන වසර තුළදී පහත සඳහන් මහ බැංකු නිලධාරීන්, රජයට හා රාජ්‍ය සංස්ථාවලට මුදා හැර තිබුණි. එච්. ආර් ද සොයිසා, එච්. එම්. ආර්. ඇල්ලෙපොල සහ පී. එම්. නාගහවත්ත යන මහතුන් මුදල් අමාත්‍යාංශයට.

ආචාර්ය එන්. රාමචන්ද්‍රන්, (බැංකු සේවාවෙන් ඒ මහතා ඉල්ලා අස්වූ 1972 මාර්තු 30 වැනි දින දක්වා) එන්. එම්. කප්පාගොඩ, ආචාර්ය එස්. එම්. පී. සූරියආරච්චි සහ පී. එම්. හසන් යන මහතුන් ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයට.

පී. එච්. සිරිවර්ධන මහතා රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට

පී. බී. කරඳවල මහතා නාවික හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට

ටී ජී. පුංචිඅප්පුහාමි මහතා රාජ්‍ය මැණික් සංස්ථාවට.

වී. එන්. ඩී. කානායක්කාර මහතා කර්මාන්ත සහ විද්‍යාකටයුතු අමාත්‍යාංශයට.

ආචාර්ය ආර්. සී. වනිගතුංග මහතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට.